**පාඩම 7**

**<u>පිලි සහිත අකුරු එකතු කර වචන කියවීම හා ලිවීම</u>**

- **'ඖ ' ශබ්දය යෙදෙන වචන**
- **පිලි නාමය - කොම්බුව සහ ගයනුකිත්ත**

**ක්‍රියාකාරකම 1**

**01 පැවරුම - පහත වාක්‍ය ශබ්ද නඟා කියවන්න.**

01. කෞශල්‍යා ගුරුවරුන්ට ගෞරවයෙන් සලකයි.

02. කෞතුකාගාරයේ පෞරාණික වස්තු තැන්පත් කර තිබේ.

03. පෞද්ගලික රෝහලට තවත් බොහෝ දුර ය.

04. සෞභාග්‍යා සෞඛ්‍ය සේවයට එක් වෙයි.

05. නෞකාධිපති නෞකාව දියත් කළේ ය.

**02 පැවරුම - ඉහත වැකිවල 'ඖ ' ශබ්දය යෙදුන වචන කොටු කරන්න.**

ක්‍රියාකාරකම 2

**'ඖ ' ශබ්දයට අනුව නිවැරදි වචනය තෝරන්න.**

01. රවුද්‍ර රෞද්‍ර

02. ලෞකික ලව්කික

03. යෞවන යව්වන

04. පවුරුෂය පෞරුෂය

05. මෞර්ය මවුර්ය